


## මෙම සමාගමේ දිවයින පුරා පිහිටි ජාත්‍යන්තර ගුවන් තොටුපොල වල පවතින පහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික ශිල්පි (පින්තාරු)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** අධීක්ෂණ නිළධාරීන් විසින් පවරනු ලබන සියළුම පින්තාරු වැඩ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව ඉටු කිරීම.

**රැකියාවේ වගකීම් :**

I සියළුම ගොඩනැගිලිවල පින්තාරු කටයුතු සිදු කිරීම.

11 අභ්‍යන්තර හා බාහිර බිත්ති, දළඹ, වහල , සිවිලිම, හා දොරවල් ගුවන් තොටුපොලට අයත් භාණ්ඩ මුර පොලු, ගේට්ටු , මාර්ග සළකුණු, ගුවන් යානා ධාවන පථ, ඒප්‍රන් සලකුණු , සහ අලංකාර වශයෙන් යෙදුන වැටවල් යනාදි සියළුම දෑ පින්තාරු කිරීම.

111 සේවා ස්ථානයට අයත් උපකරණ පිරිසිදු කිරීම හා ඒවා හොඳ තත්ත්වයෙන් නඩත්තු කිරීම.

1V අධික්ෂණ නිළධාරීන් නියම කරන උපකරණ හා ද්‍රව්‍ය ගබඩාවෙන් ලබා ගැනීම, ඒවා සුරක්ෂිතව පරිහරණය කිරීම හා සුදුසු ස්ථානවල තැබීමට කටයුතු කිරීම

V උපකරණ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම සහ ඒවා පරිහරණයේදී අලාබ හානි නොවන අන්දමට ප්‍රයෝජන ගැනීම, පින්තාරු කිරීමේදී එම ස්ථානයේ ඇති අනෙකුත් ද්‍රව්‍ය හා භාණ්ඩ වලට අලාභ හානි නොවන පරිදි කටයුතු කිරීම

VI පරිහරණය කල ද්‍රව්‍ය හා ඒවා ප්‍රයොජනයට ගත් අයුරු සටහන් කර තැබීම හා ඉතිරි ද්‍රව්‍ය උප ගබඩාවට භාරදීම

VII පලංචි බැඳීම සඳහා බඩු භාර දීම හා ගැනීම, පලංචි සවි කිරීම, ගැලවීම හා ඒවා නැවත භාරදීම.

02/-

**සුදුසුකම් :** (අ) කාර්මික විද්‍යාලයක් මගින් හෝ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.E.C.) විසින් පිලිගනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන එක් අවුරුදු (01) පූර්ණ කාලීන පාඨමාලාවක් පින්තාරු ක්ෂේත්‍රයෙන් සාර්ථකව හදාරා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) සහතිකයක් පින්තාරු ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලාව කාලසීමාවද /පුහුණු කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

සටහන : **T.V.E.C විසින් නිකුත් කරනු ලබන උපරිම මට්ටම NVQ level 3 වන අවස්ථාවේදී අදාළ ක්ෂේත්‍රයේ NVQ level 3 මට්ටමේ සහතිකයක් පින්තාරු ක්ෂේතයෙන් ලබා තිබීම හා පින්තාරු ක්ෂේත්‍රයේ වසර 06 ක සේවා පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සළකා බලනු ලැබේ.**

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප :** තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**තෝරා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනැම ස්ථානයක සේවය කල යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2025 **ඔක්තෝබර් මස 27 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ජායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Adver. 05/10/2025